www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

2019.08.05 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ලේඛන කටයුතු සඳහා පැපිරස් භාවිත කළෝ ය.
(2) සිහින අර්ථකථනය කිරීම පිළිබඳ සම්ප්‍රදායක් තිබිණි.
(3) ඖෂධ නිෂ්පාදනය සඳහා පැළෑටි භාවිත කළහ.
(4) ඔවුහු වැඩදායි නීති රීති සම්පාදනය කළහ.
(5) රෝද භාවිතය සොයා ගත්හ.

**2.** ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ ස්ථාන තුනක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) යුදයාව, සුමේරියාව, ගලීලය
(2) සුමේරියාව, ජෙරුසලම, කානා
(3) සමරියාව, මෙසපොතේමියාව, යුදයාව
(4) ගලීලය, නාසරෙත්, ජෙරුසලම
(5) නාසරෙත්, බැබිලෝනියාව, කානා

**3.** මිසරයේ ඊශ්‍රායෙල්වරුන් වහල් මෙහෙයේ යෙදී සිටි සමයේ පාලනය කළ රජතුමා කවරෙක් ද?
(1) නෙබුකද්නෙසාර්
(2) දෙවන රම්සෙස්
(3) සාර්ගොන්
(4) සයිරස්
(5) එපිපානෙස්

**4.** ජනවන්දනාව සඳහා වල්ගේට් ලතින් බයිබලය භාවිත කිරීමට තීරණය කරන ලද ජගත් මන්ත්‍රණ සභාව වන්නේ,
(1) නිසියා ය.
(2) කැල්සිඩොන් ය.
(3) එපේසස් ය.
(4) ත්‍රිදෙන්තියානු ය.
(5) පළමු වතිකානු ය.

**5.** පලස්තීන මුහුදු තීරයේ දකුණු භාගයේ දිවි ගෙවූ ජනතාව වන්නේ,
(1) ෆිනිසියානුවරුන් ය.
(2) පිලිස්තිවරුන් ය.
(3) මැකබිවරුන් ය.
(4) ඒදොම් වැසියන් ය.
(5) මොවබ්වරුන් ය.

**6.** පලස්තීනයේ බටහිර කඳුවල පිහිටා **නොමැත්තේ**,
(1) ඉහළ ගලීලය ය.
(2) ජෙරුසලම ය.
(3) සමරියාව ය.
(4) හේබ්‍රොන් ය.
(5) කාර්මෙල් කන්ද ය.

**7.** ඊශ්‍රායෙල්වරුන් අයත් වන්නේ කුමන ජන කණ්ඩායමකට ද?
(1) ඉන්දු යුරෝපීන්
(2) සෙමිටික්
(3) හික්කොස්
(4) ෆිනිෂියන්
(5) ආර්ය

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



8. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයාගෙන් පසුව පලස්තීනය පාලනය කළ රජතුමා කවරෙක් ද?
(1) සයිරස්
(2) පොම්පේ
(3) ඇන්ටියෝකුස් එපිපානස්
(4) සෙලුසිඩ්
(5) ටොලමි

9. ඊශ්‍රායෙල්වරුන් බැබිලෝනියාවේ විප්‍රවාසගතව සිටි සමයේ බැබිලෝනියාව ආක්‍රමණය කර ඔවුන් නිදහස් කර ගත් රජතුමා කවරෙක් ද?
(1) ඩේරියස්
(2) සාර්ගෝන්
(3) ටොලමි
(4) මහා ඇලෙක්සැන්ඩර්
(5) සයිරස්

10. අපර විප්‍රවාස සමයේ සමරිතානුවරුන්ගේ දේවස්ථානය පිහිටා තිබූ ස්ථානය කුමක් ද?
(1) කාර්මෙල්
(2) තාබෝර්
(3) ඉහළ ගලීලය
(4) ගෙරිසිම්
(5) හෙබ්‍රොන්

11. රෝම අධිරාජ්‍යය ගොඩනැගීම සඳහා පදනම දැමූයේ,
(1) පොම්පේ ය.
(2) රෝමුස් ය.
(3) මහා ඇලෙක්සැන්ඩර් ය.
(4) මහා හෙරෝද් ය.
(5) ජුලියස් සීසර් ය.

12. චලිතය (Motion) පිළිබඳ න්‍යාය තුනක් ඉදිරිපත් කළ විද්‍යාඥයා කවරෙක් ද?
(1) තෙයියාර්ඩ් ඩි ෂාදැන්
(2) අලෙක්සැන්ඩර් ෆ්ලෙමින්
(3) සර් අයිසෙක් නිව්ටන්
(4) ඇල්බර්ට් අයින්ස්ටයින්
(5) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්

13. මහා හෙරෝද් රජුගෙන් පසුව ජුදයාව පාලනය කරන ලද අර්කලාවුස් එම තනතුරෙන් පහ කරන ලද්දේ,
(1) රෝගී තත්ත්වයෙන් පසු වූ හෙයිනි.
(2) ග්‍රීකවරුන්ට සහාය වූ හෙයිනි.
(3) කෲරතර පාලනයට එරෙහිව ජුදා වැසියන් රෝමයට පැමිණිලි කළ හෙයිනි.
(4) ජෙරුසලමේ අන්‍ය දේව වන්දනාව පවත්වා ජනතාවට ද එසේ කිරීමට බල කිරීම නිසාවෙනි.
(5) ස්නාවක ජුවාම්තුමන්ට එරෙහිව ක්‍රියා කළ හෙයිනි.

14. ලෙයනාර්ඩෝ ඩා වින්චි අන්තිම රාත්‍රි භෝජනය චිත්‍රය සිතුවම් කළේ,
(1) සිස්ටයින් දෙව් මැඳුරු බිත්තියේ ය.
(2) ශාන්ත පීතර බැසිලිකාවේ බිත්තියේ ය.
(3) වතිකානු පුස්තකාල බිත්තියේ ය.
(4) මිලාන් නගර භෝජන ශාලාවේ බිත්තියේය.
(5) සිස්ටයින් දෙව් මැඳුරේ ඇතුළත සිවිලිමේ ය.

15. 2019 වසරේ ගින්නෙන් විනාශයට පත් වූ ගොතික් ගෘහ නිර්මාණ ශිල්පය අනුව ගොඩනැගූ දෙව් මැඳුර කුමක් ද?
(1) රෝමයේ ශාන්ත පීතර බැසිලිකාව
(2) රෝමයේ ලැටරන් බැසිලිකාව
(3) පැරීසියේ නෝත්‍රදාම් දෙව් මැඳුර
(4) ලන්ඩනයේ වෙස්ට්මිනිස්ටර් ආසන දෙව් මැඳුර
(5) කොළඹ ශාන්ත ලුසියා ආසන දෙව් මැඳුර

16. පෘතුගීසි ජාතිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණීමට ආරාධනය කළ රජතුමා කවරෙක් ද?
(1) පළමු විජයබාහු
(2) හත්වන බුවනෙකබාහු
(3) හතරවන විජයබාහු
(4) මායාදුන්නේ
(5) ධර්ම පරාක්‍රමබාහු

17. ශ්‍රී ලංකාව තුළ පළමුවරට ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නාට්‍ය භාවිත කළ පැවිදි කණ්ඩායම වූයේ,
(1) ජේසු නිකායිකයෝ ය.
(2) අගුස්තීනුවරු ය.
(3) ප්‍රැන්සිස්කන්වරු ය.
(4) ඔරතෝරියන්වරු ය.
(5) දොමිනිකානවරු ය.

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**18.** ශාන්ත පාවුලුතුමන් සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ඇරමයික් භාෂාව කථා කළ ජුදාවරයෙකි.
B - ජුදා සහ රෝම පුරවැසිභාවය ලබා සිටි කෙනෙකි.
C - ජුදා නීති රීති හා සම්ප්‍රදායන් හොඳින් දැන සිටි කෙනෙකි.
D - අන්‍ය ජාතිකයන්ගේ අපෝස්තුලුවරයායි.
E - ජුදා ගෝත්‍රයට අයත් වූවෙකි.
මේවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) B, C සහ E (5) C, D සහ E

**19.** කුරුස යුද්ධ සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ශුද්ධ වූ දේශය මුදා ගැනීම
B - තුර්කිවරුන් අතින් ශුද්ධ වූ කුරුසිය ලබා ගැනීම
C - කුරුස යුද්ධ ගණන අටකි
D - යුරෝපීය ජනතාව කුරුස යුද්ධවලට සහභාගි වීම ප්‍රතික්ෂේප කළහ.
E - කුරුස යුද්ධ පැවැතියේ 11 සිට 13 වන ශත වර්ෂය දක්වා කාලය තුළ ය.
මේවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ E (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**20.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - රෝම නගරය පිහිටියේ ටයිබර් ගඟ අසබඩ ය.
B - රෝමයේ වාසය කළ විවිධ ජන කණ්ඩායම් අතර නිරතුරුව ගැටුම් ඇති විය.
C - රෝමවරු කෘෂිකර්මාන්තයෙහි සහ යුද්ධ ශිල්පයෙහි නිපුණත්වයක් දැක්වූහ.
D - රෝම අධිරාජ්‍යය පුරා පැතිර පැවැති මාර්ග පද්ධතිය විවිධ සංස්කෘතීන් එක්සත් කිරීමට ආධාරකයක් විය.
E - රෝම ආගම හැර රෝම අධිරාජ්‍යය තුළ වෙනත් කිසිදු ආගමක් ඇදහීම තහනම් විය.
මේවායින් රෝමය සහ රෝම අධිරාජ්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D (4) B, C සහ D (5) C, D සහ E

**21.** ශාන්ත ඉග්නේසියස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ශුද්ධ වූ පාවුලුතුමන්ගේ අනුගාමිකයෙකි.
(2) අන්තියෝකියානු විද්‍යා පීඨයේ අධිපතිකම දැරී ය.
(3) ඇපලොජියා නමැති ග්‍රන්ථයේ කතුවරයායි.
(4) අන්තියොකියේ රදගුරුතුමා වූ අතර ලිපි හතක් ලියා ඇත.
(5) ඒරියානුවාදයට විරුද්ධව ක්‍රියා කළේ ය.

**22.** පහත සඳහන් සභා පියවරු අතුරෙන් ලතින් සභාවට අයත් වන්නේ කවුරුන් ද?
(1) ශාන්ත ජස්ටින්තුමා, නිසියාහි ගෙගරිතුමා හා අගුස්තීනුතුමා
(2) බැසිල්තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමා හා අම්බ්‍රෝසිතුමා
(3) නසියන්සස්හි ගෙගරිතුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමා හා ජොන් ක්‍රිසොස්ටොම්තුමා
(4) ඇතනේෂියස්තුමා, අම්බ්‍රෝසිතුමා හා බැසිල්තුමා
(5) අම්බ්‍රෝසිතුමා, ජොන් ක්‍රිසෝස්ටොම්තුමා හා අගුස්තීනුතුමා

**23.** පස්වන ශත වර්ෂයේ දී රෝමය ආක්‍රමණය කළ ගෝත්‍රය කුමක් ද?
(1) විසිගොත් (2) වැන්ඩලස්
(3) ඇන්ග්ලො සැක්සන් (4) ලොම්බාර්ඩ්
(5) ප්‍රැන්ක්

**24.** බෙනඩික්ටන නිකාය සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - එහි ආදර්ශ පාඨය යාච්ඤාව සහ වැඩ කිරීම යන්නයි.
B - ශුභාරංචිය දේශනා කිරීම සඳහා ලෝකයේ විවිධ ප්‍රදේශ කරා ගියහ.
C - යුරෝපය නාගරීකරණය කිරීම සඳහා බොහෝ සේ දායක වී ඇත.
D - පැරණි ලියකියවිලි පරිවර්තනය කිරීම කාලය අපතේ යැවීමක් ලෙස සැලකී ය.
E - යුරෝපයේ අධ්‍යාපන අභිවෘද්ධිය උදෙසා බොහෝ සේ දායකත්වය ලබා දී ඇත.
මේවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ E (3) B, C සහ D (4) B, C සහ E (5) C, D සහ E

[හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**25.** 'තාපසවරය' පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මුල් යුගයේ දී ඔවුහු තම නිවෙස්වල ම රැඳී සිටිමින් යාච්ඤාවේ ජීවිතයක් ගත කළ හ.
(2) දිළිඳුභාවය, ව්‍රත ශුද්ධිය සහ මර්දන ක්‍රියාවල යෙදීම තාපස දිවියේ ලක්ෂණ කිහිපයකි.
(3) ශුද්ධවන්තභාවය ළඟා කර ගැනීම සඳහා සමාජයෙන් හා ජනතාවගෙන් ඈත් වී සිටීම අත්‍යාවශ්‍ය ය.
(4) පෙරදිග තාපසවරය සඳහා ශාන්ත බැසිල්තුමා නීති මාලාවක් සැකසී ය.
(5) ශාන්ත ඇතනේසියස්තුමා පෙරදිග තාපස ක්‍රම අපරදිග ව්‍යාප්ත කිරීමට මහත් වෙහෙසක් දැරී ය.

**26.** ශිෂ්ටශියානු තාපස නිකාය බිහි කිරීමට හේතුව කුමක් ද?
(1) නව පැවිදි නිකායක් ඇරඹීමේ අවශ්‍යතාව මතු වීම
(2) අනෙක් දේශ කරා ධර්මදූතයන් යැවීම
(3) ආධ්‍යාත්මික වර්ධනය සඳහා අවශ්‍ය පියවරක් වීම
(4) බෙනඩික්‍ටන නිකායේ මුල් ජීවන ක්‍රමයට නැවත ජීවත් වීම
(5) එවකට පැවිදි නිකා සම්බන්ධයෙන් ජනතාව කලකිරී සිටීම

**27.** පස්වන ශත වර්ෂය වන විට යුරෝපීය රටවල් අතුරෙන් ක්‍රිස්තියානි ධර්මය මුළුමනින් වැළඳගෙන සිටි රට කුමක් ද?
(1) ඉතාලිය (2) ස්පාඤ්ඤය (3) ඩෙන්මාර්කය (4) ජර්මනිය (5) ප්‍රංශය

**28.** ස්කොට්ලන්තයේ නාම ශාන්තුවරයා ලෙස නම් කර ඇත්තේ කවරෙක් ද?
(1) ශාන්ත මහා ග්‍රෙගරිතුමා
(2) ශාන්ත පැට්රික්තුමා
(3) ශාන්ත අගුස්තීන්තුමා
(4) ශාන්ත බොනිපස්තුමා
(5) ශාන්ත කොලොම්බන්තුමා

**29.** යාචක නිකා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - සභාව තුළ ආධ්‍යාත්මික නවෝදයක් ගෙන ඒම
B - දේශනාවාදීන්ට යාචක ජීවිතය වඩාත් යෝග්‍ය වීම
C - ලෞකික සම්පත් සහ ධනය පරිත්‍යාග කිරීම
D - හිඟමන් යැදීම මගින් දෛනික අවශ්‍යතා ලබා ගැනීම
E - නව ආකාරයේ පැවිදි ජීවිතයක් අත්හදා බැලීම
මේවායින් යාචක නිකා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D (4) B, C සහ D (5) C, D සහ E

**30.** පහත දී ඇති සභා අතුරෙන් රෙප්‍රමාදූ **නොවන** සභාව කුමක් ද?
(1) ලූතරන්
(2) බැප්ටිස්ට්
(3) මෙතඩිස්ට්
(4) ඇන්ග්ලිකන්
(5) ප්‍රෙස්බිටේරියන්

**31.** ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය ඇතිවීමට බලපෑ හේතුවක් **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) සභා නායකයන් ගත කරමින් සිටි ලෞකික ජීවිතය
(2) සභාව සහ ශුද්ධ වූ රෝම අධිරාජ්‍යය අතර එවකට තිබූ බල අරගලය
(3) සභා නායකයන් දේශපාලන කටයුතුවලට මැදිහත් වීම සහ ලෞකික පාලකයන් සභාවේ කටයුතුවලට අනිසි ලෙස මැදිහත් වීම
(4) සභාව එක් පුද්ගලයකු විසින් පාලනය කිරීමට වඩා සභාවේ පාලනය විමධ්‍යගත කොට පාලනය කිරීම වඩාත් යෝග්‍යය යන අදහස ඇති වීම
(5) සභාවේ නායකයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් ගිහි විශ්වාසකයන් තුළ කලකිරීමක් ඇති වීම

**32.** පහත සඳහන් කරුණු අතුරෙන් මාටින් ලූතර්තුමන්ගේ ප්‍රධාන ඉගැන්වීම කුමක් ද?
(1) විශ්වාසය පමණක් ප්‍රමාණවත් බව
(2) දිව්‍ය සත්ප්‍රසාදයෙහි ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටීම
(3) ශුද්ධගිනිස්ථානය
(4) දේව දූතවරු
(5) පූර්ණ ඵල

**33.** මැතිව් රිච් සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - ප්‍රංශ වැසියෙකි.
B - ජේසු නිකායට අයත් පියතුමෙකි.
C - දේශීය සංස්කෘතිය අගය කළේ ය.
D - කොරියාවේ ධර්ම දූත සේවාවෙහි යෙදුණි.
E - ප්‍රසිද්ධ තාරකා ශාස්ත්‍රඥයෙකි.
මේවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ E (4) B, D සහ E (5) C, D සහ E

[පස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**34.** පහත සඳහන් කරුණු අතුරෙන් කොන්සටන්ටයින් අධිරාජ්‍යයා ඉතිහාසයට එක්වන්නේ,
(1) ක්‍රිස්තියානීන් පීඩාවට ලක් කළ හෙයිනි.
(2) ශුද්ධ වූ බයිබලය පරිවර්තනය කිරීමට සහාය වූ හෙයිනි.
(3) ක්‍රිස්තියානීන්ට ආගමික නිදහස දීම නිසා ය.
(4) ක්‍රිස්තුන් වහන්සේ ව අනුගමනය කරන්නන් ක්‍රිස්තියානීන් ලෙස හැඳින් වූ හෙයිනි.
(5) ක්‍රි.ව. 66 සිට ක්‍රි.ව. 70 දක්වා කාලයේ දී ජුදාවරුන්ට විරුද්ධ ව යුද්ධ කළ නිසා ය.

**35.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - යාපනයේ ශුභාරංචිය දේශනා කළේ ය.
B - ත්‍රිකුණාමලයේ දී හමුදාවේ අය අතර සේවයේ යෙදුණි.
C - ශුභාරංචිය දේශනා කිරීම සඳහා ධර්මෝපදේශකයන් පුරුදු කළේ ය.
D - ධර්මදූතයකු ලෙස කොළඹ දී මරණයට පත්විය.
E - දේවස්ථාන අසළ පාඨශාලා ආරම්භ කළේ ය.
මේවායින් පිලිප් බල්දේවුස් පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ E (3) A, C සහ E (4) B, C සහ D (5) C, D සහ E

**36.** යුරෝපීය මිසම් පාසල් පළමුවෙන් ආරම්භ කරන ලද පැවිදි නිකාය වන්නේ,
(1) ප්‍රැන්සිස්කානු නිකායයි. (2) ජේසු නිකායයි.
(3) බෙනඩික්ටානු නිකායයි. (4) දොමිනිකානු නිකායයි.
(5) අගුස්තිනු නිකායයි.

**37.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 'ක්‍රිස්තු අනුසාරය' යන ග්‍රන්ථය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) අපර මධ්‍යගත යුගයේ දී ලියන ලද්දකි.
(2) කුරුසියේ ශුද්ධ වූ ජුවාම්තුමා විසින් ලියන ලදී.
(3) බටහිර භාෂාවන්ට පමණක් පරිවර්තනය කර ඇත.
(4) පාප කමාවේ දේව ප්‍රසාද නිධානය පිළිබඳ විස්තර කර ඇත.
(5) ආධ්‍යාත්මික ජීවිතය පහළ මට්ටමක පැවති අවධියක ලියන ලද්දකි.

**38.** කුරුසයේ ශාන්ත ජොහාන්තුමා විසින් සම්පාදනය කරන ලද ග්‍රන්ථය කුමක් ද?
(1) ආත්මයේ රාජධානිය
(2) ක්‍රිස්තු අනුසාරය
(3) පදනම (Foundations)
(4) ආත්මයේ අන්ධකාරය රාත්‍රිය
(5) පාපොච්චාරණය

**39.** සිංහල දෙමළ කිතුනු සාහිත්‍යයේ පියා වශයෙන් ගෞරවය ලබන පියතුමා කවරෙක් ද?
(1) ජුසේවාස් (2) ජොෂප් මෙනසෙස්
(3) පිලිප් බල්දේවුස් (4) ජාකොමේ ගොන්සාල්වෙස්
(5) මිගෙල් ඩී මෙලෝ

**40.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ව එකිනෙකට වඩාත් ගැළපෙන යුගලය තෝරන්න.
(1) හය වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා - පදනම දැමීම
(2) ඊව්(ස්) කොන්ගා - ගිහියන්ට මූලිකත්වය දීම
(3) කැඳවීමට හේතුව - වෛදභේද හෙළා දැකීම
(4) නිකුත් කළ ප්‍රකාශ ගණන - ප්‍රකාශ දහ අටකි
(5) නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව - අධ්‍යාපනික අවශ්‍යතාවයන් පිළිබඳ ව කරුණු දැක්වීම

**41.** ඉන්දියානු සභාව තුළ රෝමානු කතෝලික ජන වන්දනා ක්‍රම අනුගමනය කරන සභා මොනවා ද?
(1) සීරෝ මලබාර්, ලතින් සභාව හා තෝමස් ක්‍රිස්තියානියන්
(2) සිරියන් ක්‍රිස්තියානි, සීරෝ මලන්කාර හා ජැකොබයිට් සිරියන්
(3) සීරෝ මලන්කාර, සීරෝ මලබාර් හා ඕර්තඩොක්ස් සිරියන්
(4) මලන්කාර සිරියන් ඕර්තඩොක්ස්, මාර් තෝමා සහ ලතින් සභාව
(5) සීරෝ මලබාර්, සීරෝ මලන්කාර හා ලතින් සභාව

[හයවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**42.** පිලිපීනයේ 'ශුභාරංචිය' දේශනා කළ ජාතිකයින් කවරෙක් ද?
(1) ප්‍රංශ (2) ඉතාලි (3) උතුරු අමරිකානු
(4) පෘතුගීසි (5) ස්පාඤ්ඤ

**43.** පෘතුගීසි සමයේ දී ශ්‍රී ලංකාවේ ධර්ම දූත සේවාවෙහි යෙදුණු පැවිදි නිකා හතර වන්නේ මොනවා ද?
(1) ප්‍රැන්සිස්කාන, බෙනඩිකාන සොමස්කන් හා ජේසු නිකායික
(2) ප්‍රැන්සිස්කාන, ජේසු නිකායික, දොමිනිකාන හා අගුස්තියාන
(3) නිමල මරිය, දොමිනිකාන, ක්ලැරිෂියන් හා අගුස්තියාන
(4) අගුස්තියාන, ප්‍රැන්සිස්කාන, බෙනඩිකාන හා සැලේසියාන
(5) සැලේසියාන, ජේසු නිකායික, ප්‍රැන්සිස්කාන හා දොමිනිකාන

**44.** බ්‍රිතාන්‍ය පාලන සමයේ ක්‍රියාත්මක වූ පාසල් වර්ග මොනවා ද?
(1) මිෂන් පාසල්, සෙමිනෙරි පාසල් හා රජයේ පාසල්
(2) රජයේ පාසල්, පිරිවෙන් පාසල් හා අනාථ පාසල්
(3) සෙමිනෙරි පාසල්, දේවස්ථාන පාසල් හා මිෂන් පාසල්
(4) රජයේ පාසල්, මිෂන් පාසල් හා පිරිවෙන් පාසල්
(5) රජයේ පාසල්, සෙමිනෙරි පාසල් හා පිරිවෙන් පාසල්

**45.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) 13 වන ශත වර්ෂයේ විසූ දේව ධර්ම ශාස්ත්‍රඥයෙකි.
(2) සභා ඉතිහාසඥයෙකි.
(3) අසීසියේ ප්‍රැන්සිස්තුමන්ගේ අනුගාමිකයෙකි.
(4) බොලොඤ්ඤ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර හදාරන ලදී.
(5) දේව නගරය නමැති ග්‍රන්ථය ලියන ලදී.

**46.** සමාජ සාධාරණත්වය ඉටු කිරීම සම්බන්ධයෙන් හඬ නැගූ ඇන්ග්ලිකානු සභා නායකයා වන්නේ කවුරුන් ද?
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා (2) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා
(3) මයිකල් රුද්‍රිගු පියතුමා (4) මේරි බැස්ටියන් පියතුමා
(5) එච්.එස්. ඩේවිඩ් පියතුමා

**47.** අනුරාධපුරය රාජධානිය පැවැති සමයේ ශ්‍රී ලංකාවේ පර්සියානු ජාතික ක්‍රිස්තියානීන් සිටි බව සඳහන් කර ඇති විදේශික ලේඛකයන් කවරහු ද?
(1) ඉහන්වහාබ් හා අබුසයිඩ් (2) බෙන්ජමින් රබායි සහ තිබෙත්
(3) ඉහන්වහාබ් සහ තිබෙත් (4) කෝස්මොස් ඉන්ඩෙක්ල්ප්ලාවුස් සහ තිබෙත්
(5) කොස්මෝස් ඉන්ඩෙක්ප්ලාවුස් හා අබුසයිඩ්

**48.** සභා සංවිධානයක් සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - 1947 දී බොම්බායෙහි (මුම්බායි) දී ආරම්භ වුවකි.
B - 1957 දී ඉන්දුනීසියාවේ දී ආරම්භ වුවකි.
C - බෙඳුණු සභා 100කට අධික ප්‍රමාණයක් ඒකාබද්ධ වූ සංවිධානයකි.
D - ශ්‍රී ලංකාව සාමාජික රටකි.
E - ආසියාව තුළ ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම එක් පරමාර්ථයකි.

මේවායින් 'ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය (ACC)' සම්බන්ධ ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**49.** කම්කරු ශ්‍රමයේ උදාරත්වය පිළිබඳ විශ්ව ලේඛනය ලියූ ශුද්ධෝත්තම පියතුමා කවුරුන් ද?
(1) XIII ලියෝ (2) XXIII ජුවාම් (3) VI පාවුම්
(4) II ජුවාම් පාවුලු (5) XVI බෙනඩික්

**50.** ක්‍රිස්තියානි එකමුතුව අත්‍යාවශ්‍ය වීමට හේතුව වන්නේ,
(1) ක්‍රිස්තියානි ධර්මය ලෝකයේ විශාලතම ආගම බවට පත්වීමට අවස්ථාව උදාවන නිසා ය.
(2) ලෝකය තුළ සභාවේ බලය වැඩිවීමට හේතුවන නිසා ය.
(3) පවතින සම්පත් අපතේ යාම වළක්වා ගැනීමට හැකිවන නිසා ය.
(4) ක්‍රිස්තියානීන් අතර අසමගිය ශුභාරංචිය ප්‍රකාශ කිරීමට මහත් බාධාවක් වන නිසා ය.
(5) සභාවේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට ආධාර වන නිසා ය.

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

AL/2019/49/S-II(OLD)

0324

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ජුදා සංස්කෘතිය කෙරෙහි ඊජිප්තු සහ මෝසපොතමියානු ශිෂ්ටාචාරයන්ගේ බලපෑම් පිළිබඳ ව කරුණු **හතරක්** ලියන්න.

(ii) ග්‍රීක ශිෂ්ටාචාරයේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(iii) රෝම ශිෂ්ටාචාරයේ ලක්ෂණ **හතරක්** ලියන්න.

(iv) සභාව ග්‍රීක භාෂාව යොදා ගැනීමෙන් අත් වූ ප්‍රයෝජන **හතරක්** දක්වන්න.

(v) සභාව ලතින් භාෂාව යොදා ගැනීමෙන් අත් වූ ප්‍රයෝජන **හතරක්** දක්වන්න.

(ලකුණු $4 \times 5 = 20$ යි)

**2.** (i) මිලාන් ආඥාවේ සඳහන් වගන්ති **හතරක්** සඳහන් කරන්න.

(ii) මැනකියානුවාදයේ ඉගැන්වීම් **හතරක්** ලියන්න.

(iii) මධ්‍යගත යුගයේ දී සභාවේ ආධ්‍යාත්මික පරිහානියට හේතු වූ කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iv) කුරුසියේ ශාන්ත ජුවාම්තුමන් විසින් ලියූ ග්‍රන්ථ **හතරක්** නම් කරන්න.

(v) යුරෝපයේ ක්‍රිස්තියානි ධර්මය පැතුරුණු ආකාරය පිළිබඳ ව කරුණු **හතරක්** ලියන්න.

(ලකුණු $4 \times 5 = 20$ යි)

**3.** (i) ප්‍රැන්සිස්කාන අධ්‍යාපන සේවාවේ දක්නට ලැබුණු සාධනීය කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ii) ප්‍රැන්සිස්කාන ධර්මදූතවරුන්ගේ අධ්‍යාපන ක්‍රියාකාරකම්වල දක්නට ලැබුණු අඩුපාඩු **හතරක්** ලියන්න.

(iii) ජේසුනිකායික ධර්මදූතවරුන්ගේ අධ්‍යාපනික සේවාවෙහි දක්නට ලැබුණ විශේෂතා **හතරක්** සඳහන් කරන්න.

(iv) ලන්දේසි පාලන සමයේ පවත්වාගෙන ගිය අනාථ පාසල් පිළිබඳ ව කරුණු **හතරක්** ලියන්න.

(v) බ්‍රිතාන්‍ය පාලක යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රොතෙස්තන්ත ධර්මදූත කණ්ඩායම් **හතරක්** නම් කරන්න.

(ලකුණු $4 \times 5 = 20$ යි)

## II කොටස

**4.** දේව අනුග්‍රහය පාවුලු සාහිත්‍යයෙහි දක්නට ලැබෙන මූලික ඉගැන්වීමකි.

(i) ශුද්ධ වූ පාවුලුතුමන් ඩැමැස්කස් කරා යන ගමනනේ දී ලත් අත්දැකීම දේව අනුග්‍රහයේ ඇත්දැකීමක් බව පැහැදිලි කරන්න.

(ii) “දේව අනුග්‍රහය යනු ජනතාවට ලැබුණු ජේසුස් වහන්සේගේ මරණයේ සහ උත්ථානයේ ප්‍රතිඵලයක් ලෙස දෙන ලද ත්‍යාගයකි.” සාකච්ඡා කරන්න.

(iii) දේව අනුග්‍රහය ජුදාවරුන්ටත්, ජාතීන්ටත් ලැබුණු විශේෂ ත්‍යාගයක් බව පෙන්වා දෙන්න.

(iv) දේව අනුග්‍රහයෙන් පිරුණු ජනතාවක් වශයෙන් ක්‍රිස්තියානීන් සත්‍යයට සාක්ෂි දැරිය යුත්තේ කෙසේ ද? යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු $5 \times 4 = 20$ යි)

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



**5.** ක්‍රිස්තු ධර්මය වර්ධනය වීමට හා ව්‍යාප්තියට ක්‍රිස්තියානි කලාවන් විශාල දායකත්වයක් සිදු කර ඇත.

(i) කැටකුම්බ්හි අඳින ලද චිත්‍ර මගින් මුල් ක්‍රිස්තියානීන් ලැබූ ප්‍රයෝජන විස්තර කරන්න.

(ii) ගොතික් ගෘහ නිර්මාණ ශිල්පයෙහි ඇති විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

(iii) වේදිකා නාට්‍ය රංගනය මගින් දේව රාජ්‍යයේ වටිනාකම් පතුරුවා හැරිය හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(iv) බයිසන්තියානු ගෘහ නිර්මාණ ශිල්පයෙහි ඇති විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු $5 \times 4 = 20$ යි)

**6.** ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය මගින් සභාව දෙකඩ වී ගිය ද එය සභාව තුළ අධ්‍යාත්මික නවෝදයක් ගෙනඒමට ද උපකාරී විය.

(i) ජෝන් කැල්වින්තුමන්ගේ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

(ii) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට බලපෑ හේතු දක්වන්න.

(iii) ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාව පිළිබඳ ව කෙටි විස්තරයක් කරන්න.

(iv) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව ආරම්භ වූ පැවිදි නිකායන් මගින් සභාවට සිදු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු $5 \times 4 = 20$ යි)

**7.** ක්‍රිස්තියානි ධර්මය හඳුන්වාදීම මගින් ශ්‍රී ලාංකීක ජනතාවට බහු-ආංශික ප්‍රයෝජන අත් විය.

(i) ශ්‍රී ලංකාව තුළ කතෝලික ධර්මය ප්‍රචලිත කිරීමට පෘතුගීසී ධර්මදූතවරු ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) පෘතුගීසි සමයේ ධර්මදූතවරුන් මුහුණු පෑ අභියෝග පැහැදිලි කරන්න.

(iii) ලන්දේසි ප්‍රතිසංස්කරණ ධර්මය පැතිරවීම සඳහා පිලිප් බල්දේවුස් දේවගැතිතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග පහදන්න.

(iv) ඉංග්‍රීසි අධ්‍යාපනය හඳුන්වාදීම මගින් ශ්‍රී ලාංකික සමාජයට අත් වූ ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු $5 \times 4 = 20$ යි)

**8.** ක්‍රිස්තියානි එකමුතුකම විශ්වාසනීය ක්‍රිස්තියානි සංසද බිහි කිරීමට මඟ පෑදෙයි.

(i) ශ්‍රාවකයන් අතර තිබිය යුතු එකමුතුකම පිළිබඳ ව ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම් ගැන කෙටියෙන් විස්තරයක් කරන්න.

(ii) ක්‍රිස්තියානි එකමුතුකමේ ඉතිහාසය පිළිබඳ පැහැදිලි කරන්න.

(iii) ක්‍රිස්තියානි එකමුතුකම ඇති කිරීමෙහි ලා කතෝලික සභාව මගින් සිදු වී ඇති දායකත්වය පෙන්වා දෙන්න.

(iv) ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි එකමුතුකම වර්ධනය කිරීමෙහි ලා ශිෂ්‍යයකුට ලබාදිය හැකි දායකත්ව පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු $5 \times 4 = 20$ යි)

* * *

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk